**ශීර්ෂ 252 -  ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා  දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට  ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ  දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 සැප්තැම්බර් 18 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ  148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,994.79 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,958.06 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 36.73 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.84 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 683.90 | 673.17 | 10.73 | 1.57 |
| මුලධන | 1,310.89 | 1,284.89 | 26.00 | 1.98 |
| **එකතුව** | **1,994.79** | **1,958.06** | **36.73** | 1.84 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25201 | 44.00 | 32.19 | 25.00 | 26.51 | 250.00 | 138.25 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 40.69 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 08 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 43 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 04 ක් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පරිපූරක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණු අතර එය එම වැය විෂයයන්ට අදාල මුල් ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 110 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගෙන් එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.416,126 ක් අය කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව පියවරයන් ගෙන තිබුණද 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. එසේම විවිධ ආයතනවලට ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ ණය ශේෂ එකතුව රු.192,051 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.3 අභ්‍යන්තර විගණනය**

---------------------

සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ශාඛා කාර්යාලය බැගින් හා අංශ 13 කින් සමන්විත දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරින් 04 ක් පමණක් අනුයුක්ත කර තිබුණි.

**3.4 කාර්යසාධනය**

---------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලැසුම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරික්ෂණ පහත දැක්වේ.

(අ) ජන හා නිවාස සංගණනය 2012 වාර්තාව සමස්ථ ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි සකස් කර මුද්‍රණය කිරීමට සැලැසුම් කර තිබුණද එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ආ) 2014/2015 ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණයේ ප්‍රශ්ණාවලිය සකස් කර මුද්‍රණය කිරීමට සැලැසුම් කර තිබුණද, මූලික ප්‍රශ්ණාවලිය පමණක් සකස් කර තිබුණි.

(ඇ) 2013 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයේ වාර්තාව 2014 වර්ෂය අවසානයේ ප්‍රකාශයට පත් කිරීම සඳහා සැලැසුම් කර තිබුණද, එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඈ) 2013 ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණයේ වාර්ෂික වාර්තාව 2014 වර්ෂයේ 2 වන කාර්තුවේ ප්‍රකාශයට පත් කිරීමට සැලැසුම් කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඉ) 2013/2014 ආර්ථික සංගණනයේ තොරතුරු එකතු කිරීමේ අදියර 2014 වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන්ම අවසන් කළ යුතු වුවත්, ඒ වන විටත් ක්ෂේත්‍ර කටයුතු සිදු කරමින් පැවතුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 323 | 163 | 160 |
| (ii) | තෘතියික මට්ටම | 505 | 326 | 179 |
| (iii) | ද්විතීයික මට්ටම | 771 | 709 | 62 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 175 | 155 | 20 |
| (v) | වෙනත් | 03 | - | 03 |
| | **එකතුව** | **1,777** | **1,353** | **424** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සංගණන කටයුතුවලට සෘජුවම දායකත්වය දක්වන අධ්‍යක්ෂ (සංඛ්‍යාන), නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන), සංඛ්‍යාලේඛණ, සංඛ්‍යාලේඛන නිලධාරි යන තනතුරුවල පුරප්පාඩු 272 ක් පිරවීමට කටයුතු නොකිරීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘජුවම බලපා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සංගණනවල දත්ත සැකසුම් කටයුතු හා දත්ත පරිගණකගත කිරීම, දත්ත සංගණන කටයුතු සිදු කිරීම, අන්තර්ජාලය හරහා තොරතුරු ලබාදීම් කටයුතු, දෙපාර්තමේන්තුවේ සියළුම අංශවල පරිගණක නඩත්තු හා අළුත්වැඩියා කටයුතු, දිස්ත්‍රික් මට්ටමින් දත්ත පරිගණකගත කිරීම, සැලසුම් කිරීම සාර්ථකව ඉටු කිරීම තුළින් කඩිනමින් දත්ත ලබා දීමට මඟ සැලසීම, තොරතුරු හා තාක්ෂණ අංශයේ අරමුණු වුවත් මෙම අරමුණු ඉටු කිරීම සඳහා සිටින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමමේ අනුමත තනතුරු 28 කින් 17 ක්ම පුරප්පාඩුව තිබුණි.